# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,118 — 1960 අප්‍රේල් 27 වැනි බදාදා — 27.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

**අංක වී 61 දරණ ආහාර මිළ නියෝගය.** **සහල්**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

වවුනියා දිස්ත්‍රික්කයේ උප මිළ (ආහාර) පාලක තැන්පත් පරමනාදන් වෙල්වරත්නම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) අංක 11,824 සහ 1959.7.31 දිනත් දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 49 සහ 1959.7.28 දිනත් දරණ මිළ නියෝගය අද සිට අවලංගු කරමි.

(2) මෙහි 1 වැනි උපලේඛනයේ 3 වැනි තීරයේ දක්වා තිබෙන මිළ ගණන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද, 2 වැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ දක්වා තිබෙන වැඩි කරණ ලද මිළ ගණන්, 2 වැනි උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල තොග වශයෙන් විකිණිය හැකි මිළ ගණන් බවද,

(3) මෙහි 1 වැනි උපලේඛනයේ 4 වැනි තීරයේ දක්වා තිබෙන මිළ ගණන් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද, 2 වැනි උප ලේඛනයේ 3 වැනි තීරයේ දක්වා තිබෙන වැඩි කරන ලද මිළ ගණන්, 1 වැනි තීරයේ සඳහන් ප්‍රදේශවල සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද,

(4) තවද, මෙම නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා—

(අ) විකුණනු ලබන සහල් ප්‍රමාණයක් නැවත විකුණනු සඳහා විකිණීම තොග වශයෙන් විකිණීම බවත්,

(ආ) විකුණනු ලබන සහල් ප්‍රමාණය පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස ගනු ලබන්නේ නම් එය සිල්ලරට විකිණීමක් බවත් මෙම නියෝගයෙන් දන්වමි.

(5) එසේම මෙම නියෝගයේ සඳහන් පෙදෙස්වල යම් තැනක සහල් හිමිවීමක් හෝ පාලනයක් යටතේ තබාගෙන සිටින සැම වෙළෙන්දෙකුම එකී ද්‍රව්‍යයන් ගැන මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් ප්‍රදර්ශනය කරන නිවේදනයක් එකී ස්ථානයේ හොඳින් පෙනෙන පරිදි තැබිය යුතු බැව් මෙයින් දනුම් දෙමි.

(6) එසේම මෙම නියෝගයේ සඳහන් පෙදෙස්වල සහල් තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සැම කෙනෙකු විසින්ම මිළදී ගන්නා ඉල්ලුම් කළහොත් පහත සඳහන් විස්තර ඇතුළත් රිසිට් පතක් දීමට නියෝග කරමි:—

(අ) විකුණූ දිනය;

(ආ) විකුණූ සහල්වල බර ප්‍රමාණය;

(ඇ) විකුණූ සහල් ප්‍රමාණයට ගෙවූ මුදල;

(ඈ) සිල්ලර වෙළඳාමක්ද තොග වෙළඳාමක්ද යන වග.

අත්සන් කළේ 1960 අප්‍රේල් මස 20 වැනි දින පෙරවරු 10 ට වවුනියා කච්චේරියේ දී.

ප. වෙල්වරත්නම්,
වවුනියා දිස්ත්‍රික්කයේ උප මිළ (ආහාර) පාලක.

## පළමුවැනි උපලේඛනය

වවුනියා දකුණු දෙමළ කොට්ඨාශය, ආසිකුලම්, නොච්චිමෝට්ටෙයි, නෙඩුන්කුලම් සහ පුදූකුලම්,
වවුනියා දකුණු සිංහල කොට්ඨාශය, මඩුකන්ද සහ ඊරට්පෙරියකුලම්

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| අංක | විස්තර | ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
| 1. | සහල් ... ... | 15 22 ... | 0 14 |

## දෙවැනි උපලේඛනය

| අංක | 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළවූ පළමුවැනි උප ලේඛනයේ 3 වැනි තීරුවේ ගණන් වලට පහත සඳහන් ගණන් එකතු කළ යුතුයි<br>රු. ශ. | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළවූ පළමුවැනි උප ලේඛනයේ 4 වැනි තීරුවේ ගණන්වලට පහිත සඳහන් ගණන් එකතු කළ යුතුයි<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | මරදමඩු, මරදන්කුලම්, රාසේන්දිරම්කුලම් ඇතුළත් වවුනියා දකුණු දෙමළ කොට්ඨාශය, සූදුවෙන්තපුලාවූ, උලුක්කුලම (මරදමඩුව හැර), ඇතුළත් වවුනියා දකුණු සිංහල කොට්ඨාශය ... ... | 0 25 ... | 0 01 |
| 2. | වවුනියා දකුණු සිංහල කොට්ඨාශයේ උලුක්කුලම වැයික්කියද ඇතුලත් වවුනියා දකුණු දෙමළ කොට්ඨාශයේ පෙරියපුලියන්කුලම්, වාකයිකඩ්ඩි, නාඹිලුක්කුලම්, වාලෙයිවයිතකුලම් ... ... | 0 50 ... | 0 01 |
| 3. | වවුනියා උතුරු ආදයම් නිළධාරි කොට්ඨාශයේ නෙඩුන්කර්නි, මාන්කුලම්, ඔලුමඩු, කනගරායන්කුලම් සහ පුලියන්කුලම් ... ... | 0 50 ... | 0 01 |
| 4. | වවුනියා උතුරු ආදයම් නිළධාරි කොට්ඨාශයේ පරන්දන්, මනවාලන්, පඩ්ඩමුරිප්පු, තාන්ඩුවාන්, කච්චිලෙයිමඩු සහ ඌන්ජල්කඩ්ඩි ... | 0 75 ... | 0 02 |
| 5. | වවුනියා මුහුදුබඩ කොට්ඨාශයේ මුල්ලියාවලෙයි, තන්නිඌත්තු මුලතිව්, වෙල්ලමුල්ලිවයිකාල් ... ... ... | 1 0 ... | 0 02 |
| 6. | මුලතිව් මුහුදුබඩ කොට්ඨාශයේ කුමුලාමුනෙයි, පුදුකුඩියිරිප්පු, අම්බලවාන් පොක්කනෙයි ... ... ... ... | 1 25 ... | 0 02 |
| 7. | මුහුදුබඩ කොට්ඨාශයේ කොක්කිලායි සහ කොක්කුතොඩුවායි ... | 1 50 ... | 0 03 |

**සැලකිය යුතුයි.**—මෙම මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

---

**බිඩී/58 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය** **සහල් සහ වී**

## 1950හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

බදුලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසිම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් හා 3 (2) යන වගන්තියෙන්ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 12,062 හා 1960 පෙබරවාරි 15 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක බිඩී/55 හා 1960 පෙබරවාරි 9 වෙනි දින දරණ සහල් සහ වී මිළ නියෝගය මේ දුන් පටන් අවලංගු කරමි.

(2) මීට යාකොට ඇති 1 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සහල් ශුද්ධ බර හොණ්ඩරයක් ද 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් වී ශුද්ධ බර හොණ්ඩරයක් ද තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) මීට යාකොට ඇති 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සහල් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් ද, 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් වී සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් ද විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාය්‍ය සඳහා—

(අ) සහල් සහ වී ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් සහ වී වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) සහල් සහ වී ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(5) සහල් සහ වී විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාලකිරීමෙන් සහල් සහ වී නොවිකිණිය යුතු බවත් ;

(6) සහල් සහ වී විකිණීමේ දී යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනවල සඳහන් මිළ ගණන් වලට ඇතුළත්වන බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් සහ වී යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගන සිටින සෑම වෙළෙන්දෙකු විසින් ම සහල් සහ වී සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත් ;

(8) එසේම, මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" නොහොත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් සහ වී තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල් සහ වී සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ ප්‍රමාණය ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දියයුතු බවත් මෙයින් නියම කරමි.

1960 අප්‍රේල් මස 21 වෙනි දින පෙ.ව. 9.30ට බදුලු කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ටී. අයි. කාසිම්,
බදුලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>සීමාවන් | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>වී ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| බදුල්ල සුළු නගර සීමාව, බණ්ඩාරවෙල, හල්පෙ වසමේ පිහිටි ඇල්ල ටවුම, නාඋල්ල වසමේ පිහිටි දෙමෝදර ටවුම, යටිකිඳ කොට්ඨාශයේ හාලිඇල ටවුම ... ... ... ... | 14 70 | 7 35 |
| බින්තැන්න කොට්ඨාශයේ අළුත්නුවර නගරය හා පදියතලාව ... ... ... | 16 24 | 8 12 |
| හපුතලේ කොට්ඨාශයේ කොස්ලන්ද නගරය ... ... ... ... | 15 6 | 7 53 |
| වියළුව කොට්ඨාශයේ මීගහකිවුල නගරය ... ... ... ... | 15 10 | 7 60 |
| පස්සර නගරය ... ... ... ... ... ... | 15 0 | 7 50 |
| ලුනුගල නගරය ... ... ... ... ... ... | 15 58 | 7 74 |
| වැලිමඩ නගරය ... ... ... ... ... ... | 15 16 | 7 58 |
| උඩුකිඳ කොට්ඨාශයේ දියතලාවේ නගරය ... ... ... ... | 14 84 | 7 42 |
| යටිකිඳ කොට්ඨාශයේ බල්ලාකැටුව නගරය ... ... ... ... | 14 84 | 7 42 |
| හපුතලේ සුළු නගර සභාව ... ... ... ... ... | 14 54 | 7 27 |
| හපුතලේ කොට්ඨාශයේ හල්දුම්මුල්ල නගරය ... ... ... ... | 14 74 | 7 37 |
| උඩුකිඳ කොට්ඨාශයේ පාලුගම නගරය ... ... ... ... | 15 20 | 7 60 |

## දෙවැනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>සීමාවන් | 2 වෙනි තීරය<br>සහල් ශුද්ධ බර රාත්තල් දෙකකට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. | 3 වෙනි තීරය<br>වී ශුද්ධ බර රාත්තල් දෙකකට අයකළ හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| බදුලු සුළු නගර සභාව, යටිකිඳ කොට්ඨාශයේ හාලිඇල ටවුම, බණ්ඩාරවෙල නගර සභා සීමාව, හපුතලේ කොට්ඨාශයේ හපුතලේ නගර සභා සීමාව ... ... ... ... | 0 27 | 0 13½ |
| යටිකිඳ කොට්ඨාශයේ හල්පෙ, නාඋල්ල, උඩුකුඹල්වෙල, ඉළුක්පැලැස්ස, ගවරවෙල, නාවෙල, උඩුවර, දික්වැල්ල, හාලිඇල, හැතැක්ම, ලුනුගල්ල, හිඹුරුගමුව, රඹුක්පොත, කැන්දගොල්ල, ඉඹුල්ගොඩ, මැදගම, බැද්දෙගම, කඳනවසම්, යටිකිඳ කොට්ඨාශයේ නාඋල්ල ටවුම, බල්ලාකැටුව ටවුම, නමුණුකුල ටවුම, පස්සර සුළු නගර සභා සීමාව, උඩුකිඳ කොට්ඨාශයේ ඇටම්පිටිය, දෙහිවින්න, මලිත්ත, මල්පොත, මීරහා වත්ත, රත්කරව්ව, වසම් හා ඔහිය ටවුම, උඩුකිඳ කොට්ඨාශයේ වැලිමඩ සුළු නගර සභා සීමාව, ඇටම්පිටිය ටවුම, දියතලාව ටවුම, හපුතලේ කොට්ඨාශයේ කිරවනාගම, හොරගුණේ, හල්දුම්මුල්ල, කදුරුගමුව, හපුතලේගම, කහගොල්ල, කැබිල්ලවෙල, කිනිගම, ගොරඩියකුඹුර වසම් හා කොස්ලන්ද නගරය : වියළුව කොට්ඨාශයේ නාගොල්ල, එගොඩවෙල, අන්ගොඩ, කොහොවිල, මොරගොල්ල වසම් හා කන්දෙගෙදර නගරය ... ... ... ... ... | 0 28 | 0 14 |
| යටිකිඳ කොට්ඨාශයේ බඹරගම, කනවැරැල්ල, මළස්සාගොල්ල, කනහෙල, උඩගම නැගෙනහිර, උඩගම බටහිර, තොලබෝවත්ත, පල්ලෙකිරුව, අත්තනාගල්ල, උඩපංගුව, වැදිවෙල, යපම්ම වසම් හා ලුනුගල නගරය : උඩුකිඳ කොට්ඨාශයේ මස්පන්න, වැතලාව, බඹරපනේ, කුප්පිටිය, කිරවනාගම, හපුගොල්ල, පරනගම, උඩුහාවර, කුමාරපට්ටිය, ඌමාඇල, දෙහිපොල, විදුරුපොල, පාළුගම, තෙන්නකෝන්වෙල, අඹේවෙල, තැන්නෙ කුඹුර, නැදුන්ගමුව, කොටවෙහෙර, උඩපේරුව, දික්කාපිටිය, කැටකැල්ල, ගුරුතලාව, බොරලන්ද වසම් හා පාළුගම නගරය : හපුතලේ කොට්ඨාශයේ ගම්පහ, නිකපොත, කොස්ලන්ද, කලුපහන වසම්, වියළුව කොට්ඨාශයේ කලුගහකඳුර, මැටිගහතැන්න, වැවබැද්ද, මඩුගස්තලාව, දෙමෝදර, මොරහෙල, මීගහකිවුල, කිරිඹරුව, සොරණාතොට, තැන්නෙපංගුව, පල්ලේවෙල, ගෝඩුන්න, කුඹුක්වෙල, ඉඩමේපංගුව, ගලඋඩ වසම් හා මැටිගහතැන්න නගරය හා මීගහකිවුල නගරය : බින්තැන්න කොට්ඨාශයේ අළුත්නුවර ටවුම හා පින්නගොල්ල වසම් ... ... ... ... | 0 29 | 0 14½ |
| උඩුකිඳ කොට්ඨාශයේ වැවේගම වසම, වියළුව කොට්ඨාශයේ පිටමාරුව, ඇකිරිය වසම් : බින්තැන්න කොට්ඨාශයේ අළුත්තරම, අලුත්නුවර, පංගරගම්මන, ඌරනිය, අලුකැටියාව, ඇකිරියන්කුඹුර, අරාව වසම | 0 30 | 0 15 |
| බින්තැන්න කොට්ඨාශයේ පදුකුඹුර, මහලුනුකේ, රිදීමාලියද්ද, රිටිගහඅරාව වසම් ... ... | 0 31 | 0 15½ |
| බින්තැන්න කොට්ඨාශයේ හෙම්බරව වසම ... ... ... ... | 0 33 | 0 16½ |
| බින්තැන්න කොට්ඨාශයේ වැව්ගම්පහ, කොටතලාව, බෙලිගල්ල, මහගම වසම ... ... | 0 37 | 0 18½ |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. ඒ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි, තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් හා වී ප්‍රමාණයක් දුන්නොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයකට ගෙවන ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණය කළ යුතුය.

බීඩී/59 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය | අතිරේක ආහාර ද්‍රව්‍ය—මසූර් පරිප්පු

**1950හේ අංක 29 දරණ මිළ පාලන පනත**

**අවලංගුකිරීමේ නියෝගය**

බදුලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසිම් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 පෙබරවාරි මස 15 වෙනි දිනය හා 12,062 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1960 පෙබරවාරි මස 9 වෙනි දිනය හා බීඩී/53 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝග යෙන් උපලේඛනයේ සඳහන් සීමාවන් ඇතුළත මසූර් පරිප්පු පිළිබඳව නියම කරන ලද වැඩිම මිළ මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් මස 21 වෙනි දින පෙරවරු 9.30ට බදුලු කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ටී. අයි. කාසිම්,
බදුලු දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

---

අංක 1/60 දරණ ආහාර මිළ නියෝගය. | සළාක සහල් සහ වී (තොග සහ සිල්ලර වශයෙන්)

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

පුත්තලම දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ජෝන් වින්සන්ට් ඥානප්‍රගාසම් වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) සමඟ කියවෙන 4 වෙනි වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල අනුව :—

(1) අංක 11,845 සහ 1959 සැප්තැම්බර් 2 දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 4/59 සහ 1959 අගෝස්තු 27, දින දරණ ආහාර මිළ නියෝගය සහ අංක 11,826 සහ 1959 අගෝස්තු 3 වන දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 4/59 සහ 1959 ජුලයි මස 30 දින දරණ ආහාර මිළ නියෝගය, 1960 අප්‍රේල් 11 වෙනි දින සිට මෙයින් අවලංගු කරමි.

(2) මෙයට යාකොට ඇති පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල සහල් ශුද්ධ බරින් හොණ්ඩරයක් 1960 අප්‍රේල් මස 11 දින සිට තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ එම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් බවද,

(3) මෙයට යාකොට ඇති පළමුවන උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල වී සේරු 80ක්, 1960 අප්‍රේල් මස 11 දින සිට තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛනයේ 3 වන තීරයේ සඳහන් මිළ ගණන් බවද,

(4) මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල සහල් ශුද්ධ බරින් රාත්තලක් 1960 අප්‍රේල් මස 11 දින සිට සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛනයේ දෙවන තීරයේ සඳහන් මිළ ගණන් බවද,

(5) මෙයට යාකොට ඇති දෙවන උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල වී සේරුවක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ එම උප ලේඛනයේ 3 වන තීරයේ සඳහන් මිළ ගණන් බවද මෙයින් නියෝග කරමි.

(6) තවද, මෙම් නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) මොනම වී ප්‍රමාණයක් වුවත් යලිත් විකිණීමක් වුවහොත් ඒ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත් පාරිභෝගය හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් ඒ විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් හා වී වෙන ද්‍රව්‍යයක් සමඟ කලවම් කොට හෝ බාලකොට කිසිවක් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(8) සහල් හෝ වී විකිණීමේදී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම් හෝ ඔතනු ලැබුවේ නම් එහි මිළත් මේ නියෝගයෙන් නියමිත මිළ ගණන් වලට ඇතුලත් බව මෙයින් නියෝග කරමි.

(9) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම සහල් හෝ වී වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ, මිළ පුවරුවක සඳහන් කොට එකී මිළ පුවරුව ඕනෑම ගනුදෙනු කාරයකුට පැහැදිලිව පෙනෙනසේ එම ස්ථානයේ තැබිය යුතු බවද මෙයින් නියෝග කරමි.

(10) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා,

(අ) රාත්තල හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දු පොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියෝග කරමි.

(11) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකිණීමක් කළේ නම් එසේ මිළදී ගන්න තැනැත්තා ඉල්ලා සිටිය හොත් පහත සඳහන් විස්තර ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බවද නියෝග කරමි.

(අ) විකුණූ දිනය,

(ආ) සහල් හෝ වී විකුණූ ප්‍රමාණය,

(ඇ) සහල් හෝ වී විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග.

1960 අප්‍රේල් මස 14 දින ප : ව : 2ට පුත්තලම් කච්චේරියේදී අත්සන් තබන ලදී.

ජෝ. වී. ඥාන ප්‍රගාසම්,
පුත්තලමේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## පළමුවන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>සහල් ශුද්ධ බරින් හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වන තීරය<br>වී සේරු 80ක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| දන්කොටුව, අංගම්පිටිය, වෙන්නප්පුව, කිරිමැටියාන ... | 13 61½ ... | 8 72 |
| නාත්තන්ඩිය, මාදම්පේ, හලාවත සහ ආරච්චිකට්ටුව ... | 13 72½ ... | 8 74 |
| මහවැව සහ බත්තුළුඔය ... ... ... | 13 79½ ... | 8 84 |
| උතුරු සහ දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ අනිකුත් සියළුම ප්‍රදේශ ... ... ... | 13 61½ ... | 8 72 |
| පුත්තලම ... ... ... ... | 13 88½ ... | 8 86 |
| මදුරන්කුලිය ... ... ... ... | 13 96½ ... | 8 98 |
| ඊතාලෙයි ... ... ... ... | 14 14½ ... | 9 22 |
| කල්පිටිය ... ... ... ... | 14 16½ ... | 9 26 |
| ආණමඩුව ... ... ... ... | 14 17½ ... | 9 28 |

## දෙවන උපලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශ | 2 වන තීරය<br>සහල් ශුද්ධ බරින් රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වන තීරය<br>වී සේරුවක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| උතුරු සහ දකුණු පිටිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ට අයත් සියලුම ප්‍රදේශ ... ... ... | 0 13¼ ... | 0 12 |
| පුත්තලම් උපනගර සභා කොට්ඨාශය ... ... | 0 13¼ ... | 0 12 |
| ඩච්බේ, එලවන්කුලම සහ නවගත්තේගම ... ... | 0 13¾ ... | 0 13 |
| පුත්තලම ආණමඩුව සහ කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ට අයත් සියලුම ප්‍රදේශ ... ... ... | 0 13½ ... | 0 12½ |

සැලකිය යුතුයි.—1. මේ මිළ ගණන් සහල් සහ වී විකිණීමේ නියමිත මිළ නොවේ. මේ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් සහල් සහ වී විකිණිය නොහැකිය.

2. ශුද්ධ බරින් හොණ්ඩරයකට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන සහල් ප්‍රමාණයක් හෝ සේරු 80කට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන වී ප්‍රමාණයක් ඇතහොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණයක් ගත යුතුයි.

---

මොන/ඩී/8 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය. — අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු)

### 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

#### අවලංගු කිරීමේ නියෝගය

මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසිම් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 පෙබරවාරි මස 24 වෙනි දිනය හා 12,067 වෙනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1960 පෙබරවාරි මස 19 වෙනි දිනය හා මොන/ඩී/2 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගයෙන් උප ලේඛනයේ සඳහන් සීමාවන් ඇතුලත මසූර් පරිප්පු පිළිබඳව නියම කරන ලද වැඩිම මිළ මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් මස 18 වෙනි දින පෙරවරු 10ට මොණරාගල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ටී. අයි. කාසිම්,
මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන

---

අංක 64 දරණ ආහාර මිළ නියෝගය — අතිරේක ආහාර ද්‍රව්‍ය (මසූර් පරිප්පු)

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### අවලංගු කිරීමේ නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් තම්බයියා සිවඥානම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වගන්තිය සමඟ කියවෙන 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව, 1960 පෙබරවාරි 1 දින හා අංක 12,051 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1960 ජනවාරි 26 දින හා අංක 62 දරණ මගේ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මේ නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් 22 දින පස්වරු 4ට හම්බන්තොට දී අත්සන් කරන ලදී.

ටී. සිවඥානම්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක
හම්බන්තොට දිස්ත්‍රික්කය.

මොන/ඩී/7 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය — සහල් සහ වී

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසිම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් හා 3(2) යන වගන්තියෙන් ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) අංක 12,067 හා 1960 පෙබරවාරි 24 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක මොන/ඩී/4 හා 1960 පෙබරවාරි 19 වෙනි දින දරණ සහල් සහ වී මිළ නියෝගය මේ දින් පටන් අවලංගු කරමි.

(2) මීට යාකොට ඇති 1 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ 2 වෙනි තීරයේ යඳහන් මිළ ගණන් සහල් ශුද්ධ බර හොණ්ඩරයක්ද 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් වී ශුද්ධ බර හොණ්ඩරයක්ද තොග වශයෙන්ද විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) මීට යාකොට ඇති 2 වෙනි උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සහල් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් ද, 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් වී සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් දෙකක් ද විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව නියෝග කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සහල් සහ වී ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් සහ වී වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(ආ) සහල් සහ වී ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත් ;

(5) සහල් සහ වී විකිණීමේ දී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාලකිරීමෙන් සහල් සහ වී නොවිකිණිය යුතු බවත්,

(6) සහල් සහ වී විකිණීමේදී යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහා ලනු ලැබේ නම් එහි මිළත් එම උපලේඛනවල සඳහන් මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් සහ වී යම් ස්ථානයක හෝ සිය ස්වාමීත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් සහ වී සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත් ;

(8) එසේම, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' නොහොත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(9) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් සහ වී තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම හා සහල් සහ වී සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බවත් මෙයින් නියම කරමි.

1960 අප්‍රේල් මස 18 වෙනි දින පෙ.ව. 10ට මොණරාගල කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ටී. අයි., කාසිම්,
මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය සීමාවන් | 2 වෙනි තීරය සහල් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | 3 වෙනි තීරය වී ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| වෙල්ලස්ස කොට්ඨාශයේ බිබිලේ ... ... ... ... ... | 16 0 ... | 8 0 |
| මොණරාගල කොට්ඨාශයේ මොණරාගල ටවුම ... ... ... ... | 15 84 ... | 7 92 |
| වැල්ලවාය කොට්ඨාශයේ වැල්ලවාය ටවුම ... ... ... ... | 15 38 ... | 7 69 |

### දෙවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය සීමාවන් | 2 වෙනි තීරය සහල් ශුද්ධ බර රාත්තල් දෙකකට අයකල හැකි වැඩිම සිල්ලර මිළ | 3 වෙනි තීරය වී ශුද්ධ බර රාත්තල් දෙකකට අයකල හැකි වැඩිම සිල්ලර මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| මොණරාගල කොට්ඨාශයේ මුප්පනේ ටවුම, යකුරාව, වාසිපනේ, වැකුඹුර, වරාදෙල, මියනකඳුර, හිඟුරුකඩුව, බෝගහපැලැස්ස, සහ අතලේ වසම්. වෙල්ලස්ස කොට්ඨාශයේ බිබිල වසම, වැල්ලවාය කොට්ඨාශයේ වැල්ලවාය වසම ... ... ... ... ... ... | 0 29 ... | 0 14½ |
| මොණරාගල කොට්ඨාශයේ වත්තේගම, කොහොම්බාන, ඇතිමෝලේ, කොලොන්වින්න, කිඹුල්ලැව, මුප්පනේ, බටුගම්මන, මකුල්ල, ගල්බොක්ක, ඉහව, දඹගල්ල, වසම්. වෙල්ලස්ස කොට්ඨාශයේ කෙහෙල් අත්තාවෙල, කොටගම, යල්කුඹුර, දෙඩම්ගොල්ල, බොකොගොන්න, වැගම, හැමපොල, නන්නපුරාව, කොටබෝව, සේනාපතිය, කොන්ගොල්ලවසම්. වැල්ලවාය කොට්ඨාශයේ උඩගම, මැදගම, පැල්වත්ත, ඔක්කම්පිටිය, කතරගම, තෙළුල්ල, කොටිකම්බොක්ක සහ කුරුගම වසම් ... ... | 0 30 ... | 0 15 |
| වෙල්ලස්ස කොට්ඨාශයේ පොකුලියද්ද, නිල්ගල, කටුහැමපොල, කොහුකුඹුර, බකිනිගහවෙල, පිටදෙනිය, මැදගම, පුබ්බරා, බදුලුවෙල, නිකවැටිය, නාපේ වසම්. වැල්ලවාය කොට්ඨාශයේ සිත්තරම සහ සූරියආර වසම් ... ... ... ... ... ... | 0 31 ... | 0 15½ |
| මොණරාගල කොට්ඨාශයේ පොල්ගහ ගම, දෙලිව, වරාගම, බරවාය සහ සියඹලාන්ඩුව වසම් ... | 0 32 ... | 0 16 |
| වැල්ලවාය කොට්ඨාශයේ හම්බෙගමුව වසම ... ... ... ... | 0 37 ... | 0 18½ |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. ඒ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි, තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් සහ වී ප්‍රමාණයක් දුන්නොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයකට ගෙවන ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණය කළ යුතුය.

**අංක ඇම්.ටී/6/60 දරන ආහාර මිළ නියෝගය.** **අතිරේක ආහාර ද්‍රව්‍ය. (මසූර් පරිප්පු)**

## 1950 අංක 29 දරන මිල පාලන පනත

### අවලංගු කිරීමේ නියෝගය

මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත් හෙට්ටිගේ දෙන් ටියුඩර් බෝදිදස වන මම 1950 අංක 29 දරන මිල පාලන පනතේ 4 වන වගන්තියෙන් සහ 3 (2) යන වගන්තියෙන් ද මාවෙත පැවරී තිබෙන බලතල අනුව 1960 පෙබරවාරි මස 1 වෙනි දිනය හා 12,051 වෙනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1960 ජනවාරි 27 වෙනි දිනය හා ඇම්.ටී/2/60 වැනි අංකය දරන මසූර් පරිප්පු පිළිබඳව නිකුත් කරන ලද ආහාර මිල නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

1960 අප්‍රේල් මස 25 වැනි දින පෙ. ව. 10ට මාතර දී අත්සන් කරන ලදී.

එච්. ඩී. ටී. බෝදිදස,
මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර)
මිල පාලක තැන.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.